**විසර්ජන ශීර්ෂය 138 දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය**
**යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය.**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව.

**1 කොටස.**

**දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු.**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම. |
|---|---|
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව. |

2. **ගිණුම්.**

2.1 **විසර්ජන ගිණුම.**

**මුළු ප්‍රතිපාදනය හා වියදම.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවට සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය එකතුව රු.1,391,773,600 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,063,276,624 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරි වීම් පිළිවෙලින් රු. 88,356,742 ක් හා රු.240,140,234 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 18.75 හා සියයට 26.09 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 138 | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 190,627,000 | 280,625,000 | 154,053,341 | 228,841,917 | 36,573,659 | 51,783,083 |
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 624,148,000 | 296,373,600 | 609,671,540 | 70,709,826 | 14,476,460 | 225,663,774 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එකතුව | 814,775,000 | 576,998,600 | 763,724,881 | 299,551,743 | 51,050,119 | 277,446,857 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්.

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය. | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 138 | 13801 | 85,000,000 | 7,031,290 | 3,000,000 | 8,127,400 | 36,000,000 | 19,485,964 |
| 220 | 22001 | 30,000,000 | 19,353,671 | 19,000,000 | 29,588,286 | 171,000,000 | 79,731,843 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.9,104,518 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය. |
|---|---|---|
| | | රු. |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 6000/0000/00/0015/0050/000 | 834,956 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 6000/0000/15/101 | 8,269,562 |
| එකතුව | | 9,104,518 |

## 2 කොටස.

## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1 විසර්ජන ශීර්ෂය 138 - දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

### 1.1 විගණන විෂය පථය.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛණ හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 12 දින අමාත්‍යාංශයේ ලෙකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගෙ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ.

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසි |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය |
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) අයවැය විචලනය.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පුනරාවර්තන වැය විෂයයන් 12 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.22,340,000 කින් රු.15,566,562 ක් ඉතිරි වූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 98 දක්වා වූ පරාසයක ප්‍රමාණයක් විය.

(ii) මූලධන වැය විෂයයන් 06 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.27,900,000 කින් රු.12,962,874 ක් ඉතිරි වි තිබුණු අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 64 සිට සියයට 95 දක්වා වූ පරාසයක විය.

(iii) මූලධන වැය විෂයයකට හා පුනරාවර්තන වැය විෂයයන් 03 කට සලසා තිබුණු පිළිවෙලින් රු.400,000 ක් හා රු.210,000 ක් වු ප්‍රතිපාදනය උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

--------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 13801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.400,681 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) 2005 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් වෙනත් අමාත්‍යාංශයට ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගේ රු.288.618 ක ණය ශේෂය 2006 දෙසැම්බර් මස ගිණුම් සාරාංශයෙන් පියවා තිබුණද ගිණුමෙහි එම ශේෂය සථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයක් ලෙස දක්වා තිබුණි. එම ශේෂය අමාත්‍යාංශයේ පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර ඇතත්, 2012 වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම අනුවද ඒ පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(iii) වසර 03 ක් ඉක්ම වූ අයවිය යුතු ණය ශේෂය රු 96,063 කි.

**1.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**1.4.1 <u>අභ්‍යන්තර විගණනය.</u>**

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක තනතුර 2012 ජූලි 01 දින සිට පුරප්පාඩු වී තිබුණු අතර එදින සිට අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මකව නොතිබුණි.

**1.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.**

--------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2013 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් , අමාත්‍යාංශය විසින් එම වාර්තා 2013 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුනේ 2011 වර්ෂය වෙනුවෙනි.

### (ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත ලබා තිබුණු වාහනයක සියළු නඩත්තු කටයුතු දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් කරනු ලැබුවත්, 2013 වර්ෂය වන විටත් එය අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව පවරාගෙන නොතිබුණි.

(ii) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වෑන් රථයක් 2010 මැයි 25 දින සිට සතියක තාවකාලික පරිහරනය සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ලබාගෙන තිබුණි. 2013 වර්ෂය අවසාන වන විටත් එම වාහනය ආයුර්වේද දෙපාර්තමේන්තුවට ආපසු භාරදී නොතිබුණි.

### (ඇ) බේරුම් නොකළ බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) 2012 දෙසැම්බර් 31 දිනට රු.5,766,765 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

(ii) වැය විෂයයක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය රු.101,607 කින් ඉක්මවා රු.439,810 ක බැරකම් වලට එළඹ තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### (අ) නීති,රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 104 | හානි හා පාඩු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115 (3) (ආ) | ඉකුත් වර්ෂයේ නොවැම්බර් 30 දිනට මත්තෙන් ගෙවිය යුතුව තිබුණා වු රු 10,411 සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණත් එම ගෙවීම සඳහා නිසි අධිකාර බලයලත් නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි. |
| (iii)මුදල් රෙගුලාසි 210 (2) | වැලිසර රජයේ හෝමියෝපති රෝහලේ විදුලි බිල්පත් නියමිත දිනට ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු.2,564 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවා තිබුණත් ඒ ගැන වගකිව යුතු නිලධාරින්ගෙන් එම ගාස්තු අය කරගෙන නොතිබුණි. |
| (iv)මුදල් රෙගුලාසි 760 | 2011 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වටිනාකමින් වැඩි භාණ්ඩ වර්ග 14 ක ඌනතාවයන් |

| | |
|---|---|
| | නිරීක්ෂණය වී තිබුණත් ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 772 | රජයේ හෝමියෝපති රෝහල ඇතුළු දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් සියළු ආයතනවල 2011 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේදී අපහරණය කිරීමට හදුනාගත් භාණ්ඩ වර්ග 71 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සතුව තිබුණු සංචිත වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු නිලධාරීන්ට වෙන් කළ වාහන හැර අනෙකුත් සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### තරුණ ඔසු ගොවි ගම්මාන ව්‍යාපෘතිය

තරුණ ඔසු ගම්මාන ව්‍යාපතිය ක්‍රියාත්මක කිරිම සඳහා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය විසින් අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පවතින ආසන්න ගම්මාන 05 ක ගොවින් 50 දෙනෙකු තෝරාගෙන තිබුණි. එක් කණ්ඩායමකට ගොවින් 05 බැගින් කුඩා කණ්ඩායම් 10 ක් මගින් 2010 වර්ෂයේදී එම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එකතුව රු.600,000 ක් වැය කර තිබුණි. එම ව්‍යාපතිය සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරික්ෂණයේදි පහත කරුණු නිරික්ෂණය වේ.

(අ) ප්‍රදේශය පිළිබඳ නිසි අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව හා එම ප්‍රදේශයේ කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීගේ උපදෙස් ලබා නොගෙන කටුවැල්බටු වගා කර තිබුණු අතර එම වගාව අසාර්ථක වී තිබුණි. ඊට පෙර එළබටු වගා කිරීමට කටයුතු කර තිබුණත් එම වගාවෙන් කොටසක්ද දිලීර රෝගයක් නිසා විනාශ වී තිබුණි.

(ආ) ලැබුණු එළබටු එලදාව අලෙවි කිරීමට හෝ අමාත්‍යාංශය විසින් මිලදී ගැනීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණු අතර විගණිත දිනය වු 2012 අගෝස්තු 30 දින විටත් එම එළබටු ඉදී තිබුණි.

(ඈ) වගා කිරීමේ ක්‍රම පිළිබඳව විටින් විට විවිධ උපදෙස් ලබාදී තිබුණත් කෘෂි විද්‍යාව පිළිබඳ දැනුමක් ඇති නිලධාරියෙකුගෙන් වගාව සාර්ථක කර ගැනීමට නිසි උපදෙස් ලැබී නොතිබුණි.

(ඈ) ව්‍යාපෘති යෝජනාවට අනුව සෑම කණ්ඩායමක්ම ඊළග කන්නය වගා කිරීම සඳහා නව ගොවින් 05 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් හඳුන්වා නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ මූලික අරමුණ ඔසු වගාව සඳහා ගොවීන් උනන්දු කිරීම වුවත් , විගණිත දින වූ 2012 අගෝස්තු 30 දින වන විට එම ගොවීන්ගේ අස්වනු මිලදී ගැනීමට කටයුතු නොකිරීම, හා දිලීර රෝගය නිසා විනාශ වූ වගාවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් උපදෙස් නොලැබීම වැනි හේතුන් මත වගා ව්‍යාපෘතිය පිළිබඳව ගොවීන්ගේ උනන්දුව අඩුවී තිබුණි.

(ඊ) 2012 ජුනි 24 දින අලව්ව තරුණ ඔසු ගොවි ගම්මාන ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර චාරිකා වාර්තා අනුව නිර්දේශ ලෙස යෝජනා කර තිබූ තර්ජනයට ලක්වී ඇති එළබටු වගාව ගලවා විකිණීම සහ කටුවැල් බටු වගා කිරීම සඳහා ගොවීන්ට කඩිනමින් උපදෙස් ලබාදීම යන කරුණු විගණිත දිනය වූ 2012 අගෝස්තු 30 දින වන විටත් ඉටුනොකිරිම නිසා පහත දැක්වෙන ගැටළු පැන නැගී තිබුණි.

(i) ඇතැම් ගොවීන් එළබටු ගස් ගලවා කැබල කර වේලා ගෝණිවල දමා තිබුණත් ඒවා අලෙවි කර ගැනිමට නොහැකි වීමෙන් එම වියළි ඖෂධ විනාශ වී තිබුණි.

(ii) කටුවැල් බටු තවාන්වල මල් පිපී තිබූ අතර, එම ගස් ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා ගොවීන් වෙත විගණිත දිනය වූ 2012 අගෝස්තු 30 දින වන විටත් උපදෙස් ලබාදී නොතිබුණි.

(iii) ස්ථිර භෝග ලෙස සිටුවීම සඳහා වෙළෙඳපල මිල රු.150 ක් වූ සුදු හඳුන් පැල 02 බැගින් එක් ගොවියෙකුට ලබාදී තිබූ අතර පරීක්ෂා කරන ලද වගාබිම්වල පැල 23 ක් විනාශ වී තිබුණි.

(2) වගා ව්‍යාපෘතිය ඵලදායී ව්‍යාපෘතියක් බවට පත්කිරීම සඳහා ගොවීන්ට නිවැරදි උපදෙස් ලබාදීම, එම උපදෙස් සියළුම කණ්ඩායම් අතර සන්නිවේදනය කරවීම සහ එම ගොවීන්ගේ අස්වනු මිලදී

ගැනීම සඳහා වෙළෙඳපොලක් ඇති කිරීම හෝ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඖෂධ නිෂ්පාදනාගාර සඳහා මෙම නිෂ්පාදන මිලදී ගැනීමට හෝ කටයුතු කිරීම මෙන්ම අස්වැන්න මිලදී ගන්නා තෙක් පසු විපරම් කිරීම ආදි කටයුතු සාර්ථකව වී නොතිබුණි.

## 1.8 කාර්ය සාධනය

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාර සැලැසම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හෝමියෝපති වෛද්‍ය සායන සඳහා 138-1-2-1503-1 වැය විෂයය යටතේ රු.6,600,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණු අතර රු.5,513,899 ක් වැය කර හෝමියෝපති වෛද්‍ය සායන 7 ක් පවත්වා තිබුණු අතර අලුතෙන් සායන ආරම්භ කිරීම සඳහා ස්ථාන හදුනා ගැනීම හා වෛද්‍යවරුන් පත් කර ගෙන නොතිබුණි. මේ සඳහා සලසා තිබුණු රු 1,086,101 ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

(ii) ක්‍රියාකාර් සැලැස්මෙහි, 138-.2-3-2502-2 වැය විෂයය යටතේ හෝමියෝපති වෛද්‍ය සභා ගොඩනැගිල්ල අළුත්වැඩියාව , පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම, ආරක්ෂක තාප්පය හා ගේට්ටුව අළුත්වැඩියාව සඳහා රු.12,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත් එම කටයුතු 2012 වර්ෂයේදී අවසන් කර නොතිබීමෙන් රු.5,245,572 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

(iii) වැය විෂයය අංක138-.2-3-2502-3 යටතේ ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ තරුණ ඔසු ගොවි ගම්මාන වැඩ සටහන් 4ක් සඳහා රු.95,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, පදවිය ඔසු උයන ආරම්භ කර තිබූ නමුත් හොරොව්පතාන, මධ්‍යම නුවර ගම් පළාත හා මැදවච්චිය යන වැඩසටහන් ආරම්භ කර නොතිබුණි.

(iv) තරුණයන් සඳහා නව ඔසු ගොවි ගම්මානයක් පිහටුවීම සඳහා 138- 2-3-2502-6 වැය විෂයය යටතේ රු 800,0000 ප්‍රතිපාදන සලසා තිබුණද, සැලසුම් කර තිබු ඔසු ගොවි සමාගම ආරම්භ කර නොතිබුණි.

(ආ) පෝෂණ මන්දිර වැඩසටහන

දේශීය ආහාර පාන ප්‍රචලිත කිරීම මගින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම අරමුණු කරගෙන පෝෂණ මන්දිර වැඩ සටහන ක්‍රියාත්මක කර තිබුණි. 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ඒ සඳහා රු.1,242,605 ක වැය කර දැයට කිරුළ වැඩ සටහන් යටතේ මොනරාගල ප්‍රදේශයේ පෝෂණ මන්දිරයක්ද පෝෂණ මන්දිර 03 ක් ඉදිකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෝෂණ මන්දිරයක් ඉදිකිරීමේ පරමාර්ථ ඉටුකිරීම හා එහි කාර්ය සාධනයන් පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ii) ගිවිසුම් අනුව කැද කරත්ත ලබාගත් පුද්ගලයන් මාසික ඔසු පැන් අලෙවි කර ආදායමෙන් රු.500 ක් සෞඛ්‍ය සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවත් එසේ මුදල් බැර කර ඇති බවට අදාළ ලිපිගොනු අනුව සනාථ වී නොතිබුණි.

## 1.9 පාඩු හා හානි

රජයේ හෝමියෝපති රෝහලේ රු.367,901 ක් වටිනා Globules පැකට් 2,222 කින් රු.348,198 ක් පමණ වටිනා පැකට් 2,103 ක් භාවිතයට ගත නොහැකිව රසායනාගාරයේ තැන්පත් කර තිබූ බව 2005 ජූලි 10 දින අනාවරණය වූ අතර 2013 වර්ෂය දක්වා ඒ සම්බන්ධයෙන් කිසදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

### 1.10.1 හෙළ වෙද ගෙවල් ඉදිකිරීම

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් 2006 වසරේදී ආරම්භ කර තිබුණු හෙළ වෙද ගෙදර ව්‍යාපෘතිය යටතේ 2012 දෙසැම්බර් වනවිට රු.43,438,389 ක වැයකර දිස්ත්‍රික්ක 14 ක හෙළ වෙද ගෙවල් 42 ක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් හෝ පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හෙළ වෙද ගෙවල් ඉදිකර ඇති ඉඩම් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීම හේතුවෙන් එම වෙද ගෙවල්වල අයිතිය අමාත්‍යාංශය වෙත පැවරී තිබුණත් ඒවා අඛණ්ඩව ප්‍රතිකාර කිරීම් කටයුතු සඳහා භාවිතා කළයුතු බවට හෝ වෛද්‍යවරයා විසින් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් හෝ ඊට අදාළ ගිවිසුම්වලට එළඹීමක් සිදුකර නොතිබුණි.

(ආ) අදාළ වෛද්‍යවරයාගෙන් පසු පරම්පරාව සඳහා මෙම හෙළ වෙද ගෙවල් භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳ යන්න හෝ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයිති මෙම ගොඩනැගිලිවල ඉදිරි භාවිතය පිළිබඳව සඳහන් වී නොතිබුණි.

(ඇ) මෙම හෙළ වෙද ගෙවල් අදාළ වෛද්‍යවරුන්ගේ භාවිතය සඳහා ලිඛිතව, කොන්දේසි සහිතව භාරදී නොතිබුණි.

(ඈ) මේ සඳහා වූ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 අප්‍රේල් මස 10 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 42 | 33 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ද්විතියක මට්ටම | 265 | 242 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 56 | 50 | 06 |
| | | ….. | ….. | … |
| | එකතුව | 367 | 327 | 40 |
| | | === | === | == |

2013අප්‍රේල් මස වන විටත් පුරප්පාඩු 40 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි .

## 1. විසර්ජන ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව.

### 1.1 විගණන විෂය පථය.

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 27 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස

ඉදිරිපත් කිරීම ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ.**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.11 දක්වා ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට ආදාළ විෂය අංක 22001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශ 2013 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් එය ඉදිරිපත් කර තිබුණේ දින 10ක ප්‍රමාදයකින් පසු 2013 අප්‍රේල් 10 දින දීය.

**(ආ) <u>අයවැය විචලනය.</u>**

(i) මූලධන වියදම් සඳහා රු 296,376,600 ක ශුද්ධ ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී ඉන් රු 70,709,826 ක් උපයෝජන කළ පසු ඉතිරිය රු225,663,774 ක් හෙවත් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76 ක් වී තිබුණි.

(ii) පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 15 ක් සඳහා එකතුව රු. 49,180,000 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණි.

(iii) පුනරාවර්තන වැය විෂයයන් 2ක් සඳහා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරිය රු 506,902 ක් හෙවත් සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 70ක් වී තිබුණි.

(iv) 220-2-2-0-2502(1) වැය විෂයය සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මගින් රු.20,000,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණත් ඉන් රු.2,692,392 ක් උපයෝජන කර තිබුණි. ඒ අනුව රු.17,307,608 ක් හෙවත් සියයට 87 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 8,269,562 ක් වූ අතර වර්ෂ 2 කට වැඩි කාල සීමාවක සිට පැවති රු.347,689 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 22001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 4,478,746 ක් වූ අතර , එම හිඟහිට ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය අතර වූ රු.38,225 ක වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13.5 වගන්තිය ප්‍රකාරව උත්සව අත්තිකාරම් ශේෂ වාරික 10 කින් අයකරගත යුතු වුවද, 2010, 2011 හා 2012 වර්ෂයේදී නිලධාරීන් 06 දෙනෙකුට ලබාදී තිබුණු උත්සව අත්තිකාරම් 2013 වර්ෂය වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) වෙනත් ආයතනවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 06 දෙනෙකුගේ රු.460,426 ක ණය ශේෂ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

### (අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවතුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | | ඒකක ගණන | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|---|
| බොරැල්ල ආයුර්වේද රෝහල | ජායා පිටපත් යන්ත්‍රය | 1 | 2012 මාර්තු 01 දින සිට 2013 ජූලි දක්වා |
| | ඖෂධ වියලීමේ යන්ත්‍රය | 1 | - |
| | පෙති සාදන යන්ත්‍රය | 1 | - |
| | බෙහෙත් කලවම් කරන යන්ත්‍රය | 1 | - |
| | කොළ අඹරණ යන්ත්‍රය | 2 | - |
| | විකිරණ යන්ත්‍රය | 1 | - |
| නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය - | ඩෙන්සිනෝ මීටරය | 1 | 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2013 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2011 වර්ෂය සඳහා සිදුකර තිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

2010 මැයි 25 දින දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමක් මත දෙපාර්තමේන්තු සතු වෑන් රථයක් සතියක කාලයක් සඳහා අමාත්‍යාංශය වෙත ලබාදී තිබූ වෑන් රථය 2013 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව වෙත නැවත ලබාගෙන නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.154,637,349 ක් විය.

## 2.5 අනුකූල නොවීම්

**(අ) නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (ආ) ආයතන සංග්‍රහය | | |
| (ii) VII පරිච්ඡේදය 1.6 වගන්තිය | | හල්දුම්මුල්ල, පට්ටිපොල, පින්නදූව ඔසු උයන්වල සේවකයින් ලබාගත් වැටුප් රහිත නිවාඩු දින 501 සඳහා ගෙවා තිබුණු වැටුප් සඳහා අය කරගෙන නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 94(1) | 784,000 | වාර්ෂිකව ඇස්තමේන්තු මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැදිය යුතු වුවත් 220-2-5-2103 වැය විෂය සඳහා සමාලෝචිත |

| | | |
|---|---|---|
| | | වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණද රු.784,000 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| | 30,430,827 | එසේම වගකීම් වලට බැඳීමේ අයිතිය ඇතත් අනුමත වැය ඇස්තමේන්තුව ඉක්මවා 2012 වර්ෂයේ වැය විෂයයන් 14 ක් සම්බන්ධයෙන් එකී සීමාව ඉක්මවූ මුදල රු.30,430,827 ක් විය. |
| (ii) මුදල් රෙගුලාසි 94 (2) | 33,052,472 | වාර්ෂිකව පුනරාවර්තනය වන සේවා සඳහා බැරකම් වලට බැඳීමේදී එසේ බැඳෙන මුදල ගත වූ තුන් අවුරුද්ද තුළ ඇස්තමේන්තු මුදල් ප්‍රමාණයෙන් සියයට 50 කට වැඩි නොවිය යුතු වුවත් වැය විෂයයන් 6ක් සම්බන්ධයෙන් එකී සීමාව ඉක්මවා රු.33,052,472 ක ප්‍රතිපාදන ඉක්මවා තිබුණ අතර ඒ පිළිබඳව භාණ්ඩාගාර එකඟතාවයද ලබාගෙන නොතිබුණි. |
| (iii)මුදල් රෙගුලාසි 104 | | 2011 සැප්තැම්බර් 22 දින වසර 30 ක් පමණ පැරණි සඳුන් ගසක් කපා සොරකම් කිරීම පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (iv)මුදල් රෙගුලාසි 165(4) (අ) | | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ සරප්ගේ පොත් පත් හා ලේඛන, අදාළ මාණ්ඩලික නිලධාරියාගේ පරීක්ෂාවට ලක්වී නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි හා 187(3) | 200,000 | බොරැල්ල ආයුර්වේද රෝහලේ සරප් වෙත ලැබෙන මුදල්, දින 7 කට වරක් පමණ ප්‍රේෂණය කිරීම හේතුවෙන් රු.200,000 කට ආසන්න මුදලක් සරප් අංශයේ රැඳතිබිම. |
| (vi)මුදල් රෙගුලාසි 753 (2) | | බොරැල්ල ආයුර්වේද රෝහලේ නිෂ්පාදනාගාරයේ කිසිම අංශයක් පොදු ගබඩාවෙන් වෙත ලැබෙන භාණ්ඩ වෙනුවෙන් ලැබීම් ඇනවුමක් පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (vii) මුදල් රෙගුලාසි 755 (1) | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ චූර්ණ අංශයේ සහ ක්වාථ හා තෛල අංශයේ භාණ්ඩ භාරය පැවරී තිබූ නිලධාරීන් එම අංශ වලින් මාරු වී යාමේදී තම භාරයේ පැවති භාණ්ඩ ඔහුගේ අනුප්‍රාප්තිකයාට භාර දී නොතිබුණි. |
| (viii) මුදල් 185,390 රෙගුලාසි 772 | ආයුර්වේද පර්යේෂණායතනයේ නිමි ඖෂධ ගබඩාවේ රු.185,390 ක් වටිනා භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය වසර 02ක සිට අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි |
| (ix)මුදල් රෙගුලාසි 1646 (අ) හා (ආ) | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සංචිත වාහන වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (x) මුදල් රෙගුලාසි 1647 (ඉ) | දෙපාර්තමේන්තුව විසින් වාහන ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

බොරැල්ල ආයුර්වේද රෝහලේ පංචකර්ම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංසු කැඳවීම සඳහා දැන්වීම ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පලකර තිබුණි. එක් භාෂාවකින් පමණක් එම දැන්වීම පලකිරිම නිසා ප්‍රසම්පාදනය සඳහා ලංසු කරුවන් දෙදෙනෙකු පමණක් මිළ ගණන් ඉදිරිපත් වී තිබුණි.

(ආ) ලංසු කැඳවීමට පෙර කළයුතු සියලු අළුත්වැඩියාවන් හදුනා නොගැනීම නිසා 2012 දෙසැම්බර් 31 දින වන විට රු.3,021,142 ක බිල්පතක් අතිරේක වැඩ සඳහා ඉදිරිපත් කර තිබුණු අතර එය මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 16 ක් පමණ වී තිබුණි.

(ඇ) ඉහත අළුත්වැඩියාවට අදාළව ඇස්තමේන්තු සැදීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) දෙවන මහලේ අළුත්වැඩියා කටයුතු නිමකර භාරදී තිබුණත් එහි වැසිකිලියකට ඉහළ මාලයෙන් ජලය කාන්දු වී තිබුණි.

(ඉ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව මෙම අළුත්වැඩියාව 2012 මාර්තු 02 දින විට කළ යුතු වුවත් විගණිත දින වන 2012 දෙසැම්බර් 02 දින වන විටත් අවසන් කර නොතිබූ අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි

## 2.7 කාර්ය සාධනය

(අ) 2012 ක්‍රියාකාර සැලැස්මේ තිබුණු පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) ආයුර්වේද පර්යේෂණායතනයේ ආයුර්වේද ඖෂධ සඳහා ගනු ලබන තෝරාගත් පලතුරු එළවළුවල antioxygen ප්‍රතිශතය බැලීම

(ii) ක්ෂුද්‍ර ජීවී රසායනාගාරය වැඩිදියුණු කොට පර්යේෂණ පැවැත්වීම

(iii) ඖෂධීය ශාඛ පිළිබඳ උසස් පෙළ සිසුන් සඳහා කුඩා අත්පොතක් සැකසීම

(iv) පටක රෝපණ අංශය වසරකට වැඩි කාලයක් අක්‍රියව පැවතීම නිසා පටක රෝපණ තාක්ෂණයේ රත්හඳුන් කිනක රෝපනය මගින් එහි අත්‍යාවශ්‍ය රසායනික සංයෝග නිස්සාරණය කිරීම පිළිබඳ පර්යේෂණ සිදුකිරීම.

(ආ) <u>රෝහල් කාර්ය සාධනය</u>

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලේ ක්‍රියාත්මක සැලැස්මෙහි දක්වා තිබුණු කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) දස මහල් රෝහල් සංකීර්ණය ඉදිකිරීමේ මූලික කටයුතු
(ii) දස මහල් රෝහල් සංකීර්ණය ඉදිකිරීමට ප්‍රථම තාවකාලික කාර්යාල සංකීර්ණය ඉදිකිරීම
(iii) එළිමහන් මුරකුටි දෙකක් ඉදිකිරීම
(iv) නව ගොඩනැගිල්ල ඉදිකිරීම හා ආසන්නයේ ඇති ඉඩම රෝහල වෙත පවරා ගැනීම
(v) වඩාත් පුළුල් වූ වාට්ටු සංකීර්ණයක් සථාපනය කිරීම (ළමා, භික්ෂු හා මාතෘ වාට්ටු ද ඇතුළත් වන පරිදි)

(vi) නවීන උපකරණ හා පුහුණු පරීක්ෂකවරුන්ගෙන් සමන්විත අංග සම්පූර්ණ රෝග නිධාන පර්යේෂණාගාරයක් ඇති කිරීම

(vii) වඩාත් පහසුකම් සහිත පංචකර්ම ප්‍රතිකාර අවස්ථා ඇති කිරීම සඳහා පංචකර්ම ඒකක දෙක තුළ බිම ටයිල් කිරීම, පැන්ට්‍රි කබඩ් සෑදීම, ඇතුළත කොටස් වෙන්කිරීම සහ අවශ්‍ය උපකරණ ලබාගැනීම.

(ඇ) <u>ඔසු උයන්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවට අයත් පන්නදුව සහ හල්දුම්මුල්ල ඔසු උයන්වල පිළිවෙලින් සංවර්ධනය කර නොමැති භූමි ප්‍රමාණය අක්කර 1ක් හා 4ක් වූ අතර පට්ටිපොල ඔසු උයනේ එම ප්‍රමාණය ගණනය කර නොතිබුණි.

(ii) ඔසු උයන්වල සමාලෝචිත වර්ෂයේ ආදායම හා සසඳන කල වියදම අතර පහත සඳහන් විශාල විචලනයන් සිදුවී තිබුණි.

| ඔසු උයනේ නම | ආදායම | වියදම | වියදම ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | සියයට. |
| පින්නදූව | 1,300,084 | 4,927,616 | 379 |
| හල්දුම්මුල්ල | 2,044,901 | 53,206,966 | 2,602 |
| පට්ටිපොල | 291,325 | 19,635,251 | 6,740 |

(iii) සියලුම ඔසු උයන් වාර්ෂිකව සිදුකරනු ලබන ඔසු පැල නිෂ්පාදනයේ සැලකිය යුතු විචලනයන් පවතින බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ

| ඔසු උයනේ නම | පැල ප්‍රමාණය | | |
|---|---|---|---|
| | 2010 | 2011 | 2012 |
| පින්නදූව | 44,254 | 58,186 | 69,358 |

| | | | |
|---|---|---|---|
| හල්දුම්මුල්ල | 11,730 | 32,819 | 44,278 |
| පට්ටිපොල | 5,994 | 8,241 | 5,767 |
| | ----------- | ----------- | ---------- |
| | 61,978 | 99,246 | 119,403 |
| | ====== | ====== | ====== |

(iv) ඔසු උයන් පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- ඔසු උයන්වලින් දෙපාර්තමේන්තුවේ රෝහල් නිෂ්පාදනාගාරවලට සහ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ඖෂධ අමුද්‍රව්‍ය ලබා ගැනීම ඉතා අඩු මට්ටමක පැවතීම
- භාණ්ඩ හා ඔසු පැල සමීක්ෂණ කටයුතු සිදු නොකිරීම
- ඖෂධ ශාඛ පිළිබඳ ලේඛණයක් පිළියෙල නොකිරීම
- ඖෂධ පැලැටි නාමකරණයක් නොතිබීම
- ඔස උයන් පිහිටා ඇති ඉඩමේ සැලැස්ම හා අදාල මාර්ග නිරවුල් කිරීමට කටයුතු නොකිරීම
- අතිකාල සහ ගමන් වියදම් අධික බව
- සේවකයින්ගේ පැමිණීම හා නිවාඩු ලබා ගැනීම අසතුටුදායක වීම
- ඔසු උයන් පවත්වා ගෙන යාමට අවශ්‍ය භෞතික සම්පත් අවශ්‍ය වේලාවට ලබා නොදීම,

(v) පින්නදූව ඔසු උයනේ 2012 වර්ෂයේ රු.461,020 ක් වටිනා ඖෂධ පැලැටි නොමිලේ නිකුත් කර තිබුණ ද. ඒ සම්බන්ධව විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) පින්නදූව ඔසු උයනේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම තුළ දක්වා තිබූ පහත සඳහන් කාර්යයන් ඉටු කර නොතිබුණි.

* උද්‍යානය සඳහා නාම පුවරුවක් සවි කිරීම (උදා. ඔසු උයනට පිවිසෙන මාර්ගයේ නාම පුවරුවක් නොතිබීම)

- * රෝපණ ද්‍රව්‍ය නඩත්තුව සඳහා දැල් ගෘහයක් තැනීම
- * රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පොලිතින් ගෘහ තැනීම
- * වැල් සහිත විශේෂ ආරුක්කු ඇති කිරීම
- * ඖෂධීය ශාඛ කොටස් එකතු කිරීමේ හා සැකසීමේ මධ්‍යස්ථානයක් තැනීම
- * උද්‍යානය තුළ summer hut, කබානා, බංකු සැකසීම
- * ජලජ විශේෂ සඳහා පොකුණු ඇති කිරීම
- * වගා කර නොමැති භූමිය (අක්කර 1.5) වගා කිරීම
- * ඔසු පැල අලෙවි ප්‍රවර්ධන කටයුතු
- * ඔසු උයනේ ඖෂධ පැල සංවර්ධනය සඳහා තාක්ෂණ උපදෙස් ලබාදීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාසැල් ළමුන් දැනුවත් කිරීම, සහන මිලට ශාඛ රෝපිත ලබාදීම හා ප්‍රචාරණය

(vii) හල්දුම්මුල්ල ඔසු උයනේ හරිතාගාර ගෘහයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා රු.1,690,416 කට රජයේ කර්මාන්ත ශාලාව වෙත කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණ ද විගණිත දින වූ 2013 මැයි 07 දින වන විටත් එහි අළුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි.

(viii) හල්දුම්මුල්ල ඔසු උයනේ පැරණි දේශන ශාලාව අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු සකස්කිරීම සිදුකර නොතිබුණි.

(ix) හල්දුම්මුල්ල ඔසු උයනේ අක්කර 04 ක පමණ භූමි ප්‍රමාණයක් පිරිසිදු කොට වගා කටයුතු සඳහා යොදා ගැනීම, මායිම් වැට පැහැදිලි ලෙස සුරක්ෂිත කිරීම, පැරණි දේශන ශාලාව අළුත්වැඩියා කිරීම, කාර්යාලය පින්තාරු කිරීම හා බිංකොහොඹ හරිතාගාර ගෘහය අළුත්වැඩියා කිරීම, යනාදී කාර්යයන් ඉටුකර නොතිබුණි.

(x) පට්ටිපොල ඔසු උයනේ සංචාරක නිවාසය සඳහා මුළුතැන්ගෙය රු.2,699,394ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ 2013 පෙබරවාරි 15 වීමට ප්‍රථම ඉදිකර භාර දිය යුතු වුවත්, 2013 ජුනි මස වන විටත් එය ඉදිකර අවසන් කර නොතිබුණි.

(xi) සමාලෝචිත වර්ෂයේ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම අනුව පට්ටිපොල ඔසු උයනේ ඉටුකල යුතුව තිබුණු පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

- දැල් ගෘහයක් තැනීම
- නළ ළිඳක් ඉදි කිරීම
- ගවයින් සඳහා කුඩා ගව ගාලක් ඉදි කිරීම
- ප්‍රධාන ගේට්ටුවක් ඉදි කිරීම හා ඒ අසල පැල අලෙවි සැලක් කුඩා ළමා උද්‍යානයක් වැසිකිළි යුගලක් ඉදි කිරීම
- වීදුරු ගෘහය තින්ත ආලේප කිරීම
- පංචකර්ම වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කිරීම
- සංචාරක නිවාසයේ ප්‍රයෝජන සඳහා ජීව වායු ඒකකයක් ඉදි කිරීම
- ක්ෂේත්‍රයේ පිරිමි සහ ගැහැණු අයවලුන්ට වැසිකිළි 02 ක් ඉදි කිරීම

## 2.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද කර තිබීම 2010 ඔක්තෝබර් සිට 2012 නොවැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.14,005 ක දඩ පොළී ගෙවා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ වැවී තිබුණු වසර 30 ක් පමණ පැරණි සඳුන් ගසක් 2011 සැප්තැම්බර් 22 දින සොරකම් කරගෙන තිබුණත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 මාර්තු 07 දිනැති අංක 03/05/01/2/14 දරන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ ලිපියට අනුව 2012 ඔක්තෝබර් 10 දින පල්ලෙකැලේ ඔසු උයන් භූමියේ සුදු සඳුන් ගසක් කපාගෙන ගොස් තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) හල්දුම්මුල්ල ඔසු උයනේ බිංකොහොඹ රෝපණය සඳහා ඉදිකර තිබුණු හරිතාගාර ගෘහයේ වහලය දිරාපත් වී අලුත්වැඩියා නොකිරීම නිසා වැසි ජලය වැටීම හේතු කොටගෙන බිංකොහොඹ පැළ 200 ක් සහ මව් ශාක 16 ක් විනාශ වී තිබුණි. බිංකොහොඹ පැළයක වටිනාකම රු.100 ක් වන අතර මව් ශාකයක

වටිනාකම ගණනය කර නොමැති බැවින් ආසන්න වශයෙන් රු. 20,000 ක පාඩුවක් සිදුවී තිබුණි

(ඉ) යක්කල ආයුර්වේද රෝහලේ බෙහෙත් ශාලා කම්කරුවකු 2001 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා ලබාගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු දින 322 1/2 ක් සහ අඩ වැටුප් දින 35 ක් සඳහා අයකළ යුතු රු.65,843 ක මුදල විගණිත දිනය වූ 2014 මාර්තු 06 දින වන තෙක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) නිවාඩු ලේඛනවලට අනුව සේවකයින් 85 ක් 2010 හා 2011 වර්ෂවලදී අඩවැටුප් හා වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි විගණිත දිනය වූ 2013 පෙබරවාරි මස වන විට එම මුදල් අදාළ සේවකයන්ගේ වැටුපෙන් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. සේවකයින් 51 කගේ වැටුපෙන් අයකර ගත යුතු මුදල රු.247,382 ක් වූ අතර සේවකයින් 34 ගෙන් අයකරගත යුතු මුදල ගණනය කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) විගණිත දිනය වූ 2013 පෙබරවාර මස වන විට යක්කල ආයුර්වේද රෝහල් ගබඩාවේ තිබූ කල් ඉකුත් වූ ඖෂධවල වටිනාකම රු.10,872 ක් වූ අතර, වටිනාකම රු.6,589 ක් වූ නිම් ඖෂධ බෝතල්වලට මීයන් හානි කර තිබුණි.

## 2.9 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයුර්වේද පර්යේෂණායතනය 2005 වර්ෂයේදී මිලදීගත් රු.14,605,000 ක් වටිනා GCMS යන්ත්‍රය රසායනාගාරය තුළ පූර්ණ භාවිතයකින් තොරව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන 2012 ඔක්තෝබර් 24 දින යක්කල ආයුර්වේද රෝහලට භාරදී තිබුණු කොහු මෙට්ට 50 ක් භාවිතා කිරීමට නොහැකිව ගොඩගසා තිබුණි.

**2.10 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) දෙපාර්තමේන්තුව විසින් බොරැල්ල ආයුර්වේද රෝහලට, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයට හා ආයුර්වේද පුහුණු ආයතනයට එකක් රු.72,950 ක් බැගින් වූ මල්ටි මීඩියා යන්ත්‍ර 6 ක් තාක්ෂණික ඇගයීම් කමිටුව නිරීක්ෂණයකින් තොරව මිලදී ගෙන තිබුණි.

(ආ) ආයුර්වේද පර්යේෂණායතනයේ පුස්තකාලයේ පොත් පරිහරණය කර ආපසු භාරදීමට දින නියම කර නොතිබුණි. වසරකට වැඩි කාලයක් පුස්තකාල පරිශීලකයන් විසින් අවස්ථා 14 කදී පොත් 19 ක් රඳවාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නැවත පොත් ලබාගැනීම හෝ නැති වූ පොත්වල වටිනාකම අදාළ පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහලේ බාහිර රෝගී අංශයේ තොග පොත්වල සඳහන් තෙල ප්‍රමාණය සහ භෞතික ශේෂය අතර පහත සඳහන් වෙනස්කම් පැවතුණි.

| තෙල වර්ගය | 2013 පෙබරවාරි 07 දින පොත් අනුව ශේෂය | භෞතික ශේෂය | වෙනස |
|---|---|---|---|
| | බෝතල් | බෝතල් | බෝතල් |
| සර්ෂපාදී තෛලය | (628) | 00 | 628 |

| | | | |
|---|---|---|---|
| නීලාායාදී තෛලය | 1137 | 1110 | (27) |
| බාකුචි තෛලය | 75 | 150 | 75 |
| පිණ්ඩ තෛලය | (1135) | 60 | 1395 |
| පීනස් තෛලය | 4530 | 4875 | 345 |

.

(ඈ) දෙපාර්තමේන්තුවට අයත් ආයුර්වේද රෝහල්වල නේවාසික රෝගීන්ට ආහාර සැපයීම සම්බන්ධයෙන් විධිමත් හා පැහැදිලි උපදෙස් එම රෝහල් වෙත ලබාදී නොතිබුණි. (උදාහරණයක් ලෙස රෝගියෙකුට එක් ආහාර වේලක් සඳහා ලබාදිය යුතු ආහාර ප්‍රමාණය පිළිබඳව දක්වා නොතිබීම)

(ඉ) දෙපාර්තමේන්තුව විසින් ආයුර්වේද සේවා (පංචකර්ම) ආයතන ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අළුත්කිරීම පිළිබඳව සහතික ලබාදීම සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව විගණනයේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(i) 2013 මාර්තු 11 දින වන විට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද සේවා (පංචකර්ම) ආයතන ලෙස ලියාපදිංචි වී තිබූ ආයතන සංඛ්‍යාව 107 ක් වී තිබුණි. ඒවායේ සිදු වන සේවා පිළිබඳව වසරකට වරක්වත් පරීක්ෂා කර ලියාපදිංචිය යාවත්කාලීන නොකිරීම සහ නැවත පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මකවීම අවම මට්ටමක පැවතුණි .

(ii) පෞද්ගලික ආයුර්වේද (වෛද්‍ය හා ආශ්‍රිත) සේවා ආයතන ලියාපදිංචි කිරීම පිළිබඳ නියෝග සැකසීම සඳහා වන කමිටුව 2012 අප්‍රේල් මස රැස්වී තිබුණද, එම නියෝග 2013 මාර්තු 11 දින වන විටත් අනුමත වී නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව මගින් 2010 ජනවාරි 04 දින බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට භාර දී තිබුණු ගිලන් රථයක් 2012 වර්ෂයේ සිට 2013 පෙබරවාරි දක්වා සාමාන්‍ය ප්‍රවාහන කටයුතු සඳහා අවස්ථා 15 ක් යොදා ගත් බව නිරීක්ෂණය විය බහුල වශයෙන් වෛද්‍යවරුන්ගේ සහ නිලධාරීන් නිවාසවලට යාමට සහ බැංකු කටයුතු සඳහා එය භාවිතා කර තිබුණි. මේ සඳහා වැය වු දුර ප්‍රමාණය තහවුරු කරගත නොහැකි විය.

(උ) ආයුර්වේද පර්යේෂණායතනය 2011 මැයි 24 දින එකක් රු.42,500 ක් බැගින් රු.85,000 ක් වැයකර වේලා සටහන් යන්ත්‍ර දෙකක් මිලදී ගෙන තිබුණද, වේලා සටහන් යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

(ඌ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලෙහි පුස්තකාලය පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පුස්තකාල පරිපාලනය වෛද්‍යවරයෙකු වෙත පවරා තිබූ අතර, වෛද්‍යවරයාගේ කාර්ය බහුලත්වය මත පුස්තකාලය දිනපතා විවෘත කර නොතිබුණි.

(ii) පුස්තකාලයේ විධිමත් පරිග්‍රහණ ලේඛනයක් නොතිබුණි.

(iii) බැහැරට ගෙන යන පොත් පිළිබඳ විධිමත්ව සටහන් කර නොගැනීම හා පුස්තකාලයේ භෞතිකව පැවති පොත් 112 ක් ලේඛනගත කර නොතිබුණි.

(iv) පුස්තකාලයේ පොත්පත් පරිහරණය කිරීම ඉතා සළු මට්ටමක පැවතීම සහ පොත්පත්වලින් ප්‍රයෝජනයක් නොගැනීම සහ මට්ටමක පැවතීම නිසා පුස්තකාලයේ භෞතික සම්පත් නිෂ්කාර්ය වී තිබුණි.

(එ) ආයුර්වේද පර්යේෂණායතනයේ කාර්යාල පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) පැමිණීමේ ලේඛනය දෛනිකව වසා දැමුවද රතු ඉර ගැසීමේදී යොදන වේලාව පසව පැමිණෙන නිලධාරීන්ට අත්සන් කිරීමට හැකිවනු පිණිස නැවත වෙනස්කර තිබුණි.

(ii) නිලධාරීන් පැමිණීමේදී හා පිටවීමේදී යොදන වේලාවන් පසුව වෙනස්කර තිබුණි.

(iii) පුරුද්දක් වශයෙන් සමහර නිලධාරීන්ට පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට අමතකවීම සහ පස දින එය පැමිණීමේ ලේඛනයේ අවිධිමත් ලෙස සටහනකින් දක්වා තිබුණි.

(iv) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 21 ක් වුවද, දැනට 10 දෙනෙකු පමණක් සේවය කර තිබුණි.

(ඒ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදිත ඖෂධ ඇසුරුම් කරන තෙක් කල්ක, චූර්ණ ආදී ඖෂධ වර්ග භාජනවලින් පිටතට නිරාවරණය කර තැබීම හේතුවෙන් ජලය, දූවිලි හා අපද්‍රව්‍ය මිශ්‍ර වීමේ හැකියාවක් තිබුණි.

(ඔ) බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ගෙවන වාට්ටු සංකීර්ණය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(i) ගෙවන පිරිමි වාට්ටුවේ කෑම බෙදන කාමරයේ සිවිලිම කඩා වැටීමේ අවදානමක් පැවතීම

(ii) කාමර අංක 08 සහ 09 යෙහි වැසිකිලි දොරවල් සහ අගුල් කැඩී තිබුණි.

(iii) රෝගීන්ගේ කාමරවල ජනෙල් පියන් වැසීමට නොහැකි වී තිබුණු අතර ඒවා ගැටගසා තිබුණි.

(iv) කාමරවල දොර පියන් දිරා තිබුණි.

(v) ගෙවන ගැහැණු වාට්ටුවේ අංක 03 කාමරයේ ජනේලයක පියනක් නොතිබුණි.

(vi) කාමරවලට සිවිලිමෙන් ජලය කාන්දු වන බව නිරීක්ෂණය විය.

(vii) ඇතැම් වැසිකිලිවල කරාම ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

(ඕ) දෙපාර්තමේන්තුවේ සංචිත වාහනවල දෛනික ධාවන සටහන් පිළිබඳව කළ නියැදි පරීක්ෂාවේදී දෛනික ධාවන සටහන් වල ලබාගත් ඉන්ධන ප්‍රමාණය හා ලබාගත් අගයන් පරීක්ෂා කර වාහන භාර නිලධාරියා අත්සන් කර නොතිබුණි.

(ක) යක්කල ආයුර්වේද රෝහලේ වියළි ඖෂධ ගබඩාවේ තොග පොත්වල සඳහන් වියළි ඖෂධ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 77.155 වූ ද භෞතික තොග ශේෂය කිලෝ ග්‍රෑම් 66.2 විය එ අනුව වියළි ඖෂධ කිලෝ ග්‍රෑම් 11.555 ක අඩුවීමක් අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ග) පරිත්‍යාග වශයෙන් රෝහලට ලැබෙන වියළි ඖෂධ තොග පොත්වලට ගත යුතු වුවත් යක්කල ආයුර්වේද රෝහලට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණි වියළි ඖෂධ ගබඩාවේ තොග පොත්වල ඇතුළත් කර නොතිබුණි.

(ච) කල් ඉකුත් වූ කි.ග්‍රෑ. 44 ක පමණ කංසා තොගයක් 2013 පෙබරවාරි වන විටත් වියළි ඖෂධ ගබඩාවේ පැවතුණි.

(ජ) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලේ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදිත නිමි ඖෂධ නිකුත් කිරිම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) එකම වට්ටෝරු අංකය භාවිතා කර ඖෂධ නිකුත් කර තිබුණි.

(ii) 2013 ජනවාරි 08 දින වට්ටෝරු අංක A-557868 යටතේ රක්තශෝධක ක්වාථය බෝතල් 50 ක් නිෂ්පාදනාගාරයෙන් නිකුත් කළ ලෙස සටහන් වී තිබුණත් එය නිමි ඖෂධ ගබඩාවේ තොග පොතේ සටහන් වී නොතිබුණි.

(iii) නිෂ්පාදන අංශයෙන් ගබඩාවට නිමි ඖෂධ භාරදෙනවිට එම ඖෂධ භාරගත් නිලධාරියා විසින් නිෂ්පාදනාගාරයේ ඖෂධ භාරදීමේ පොතේ අත්සන් කර නොතිබුණි.

(iv) නිෂ්පාදනාගාරයෙන් ගබඩාවට ඖෂධ බෝතල් නිකුත් කිරිමේදි එක් අවස්ථාවක ප්‍රමාණය හා දිනය සඳහන් කර නොතිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 228 | 198 | 30 |
| (ii) | තෘතියික මට්ටම | 131 | 47 | 84 |
| (iii) | ද්විතියක මට්ටම | 280 | 168 | 112 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 851 | 590 | 261 |
| | එකතුව | 1490 | 1003 | 487 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 487 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.